# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය (පුනර්) - ප්‍රථම වසර - 2018

## නීති විධි ක්‍රම

**පැ තුනයි (03)**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව - 07

ඕනෑම ප්‍රශ්න <u>හතරකට (04)</u> පමණක් පිළිතුරු සපයන්න.
(අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.)

---

**01.** "මූලික අයිතීන් සහ නිදහස ආරක්ෂා කිරීමට නිර්මිත සමාජය උදෙසා වූ රීති මාලාවක් ලෙස නීතිය පවතියි. කෙසේ නමුත් නීතිය සදාචාරයට ද සමානව තිබිය යුත්තේය."

නීතිය සදාචාරය සමානව පැවතිය යුතුයයි ඔබ සිතන්නෙහි ද? ඕනෑම නීති ක්ෂේත්‍රයක් ඇසුරින් නිදසුන් දක්වමින් හේතු දක්වන්න. අදාල නීති විද්‍යාත්මක ගුරුකුල වෙත අවධානය යොමු කිරීම ද ඔබගෙන් අපේක්ෂිතය.

**02.** විනිසුරුවරයාගේ කාර්යභාරය කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් එදිරිවාදී සහ විමර්ශනවාදී පද්ධතියෙහි ප්‍රධාන ලක්ෂණ සාකච්ඡා කරන්න.

**03.** ඕනෑම ව්‍යවස්ථා අර්ථනිරූපණ රීතීන් දෙකක් සන්සන්දනය කරමින් පටහැනිතා දක්වන්න.

ඔබගේ පිළිතුර පැහැදිලි කිරීම සඳහා නඩු තීරන නීතියෙහි නිදසුන් උපුටා දැක්වීම ඔබගෙන් අපේක්ෂා කෙරෙයි.

04. X,Y සහ Z යන කරුණු පදනම් වූ නඩුවක් ශ්‍රී ලංකාවේ අභියාචනාධිකරණයෙහි ද්විපුද්ගල විනිශ්චය මණ්ඩලයක් ඉදිරියෙහි විභාග වෙමින් පවතියි. ඔබගේ පිළිතුර සනාථ කිරීම සඳහා අදාල අධිකාරීන් උපුටා දක්වමින් පහත දැක්වෙන නඩු තීරණවල අනුකූලතාවය සාකච්ඡා කරන්න:

(අ) X, Y සහ Z යන කරුණු පදනම් වූ 2017 වසරේදී ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පූර්ණාධිකරණයක් (Full Bench) ලබාදුන් තීන්දුවක්;

(ආ) X,Y සහ Z යන කරුණු පදනම්ව ශ්‍රී ලංකාවෙන් ඉදිරිපත් වූ අභියාචනයක් සම්බන්ධයෙන් රාජාධිකරණය ලබාදුන් තීන්දුවක්;

(ඇ) X,Y සහ Z යන කරුණු පදනම්ව ඉන්දියාවේ ශ්‍රේෂ්ඨාධිකරණය 2015 වසරේ දෙසැම්බර් මස ලබාදුන් තීන්දුවක්; සහ

(ඈ) X,Y සහ Z යන කරුණු පදනම් ව ශ්‍රී ලංකාවේ අභියාචනාධිකරණයෙහි ද්විපුද්ගල විනිශ්චය මණ්ඩලයක් විසින් 2018 වසරේදී ලබාදුන් තීන්දුවක්.

05. නීති මූලාශ්‍රයක් වශයෙන් 'චරිත්‍රයක' වැදගත්කම සහ එහි වලංගුතාවය තීරණය කිරීමේදී ශ්‍රී ලංකාවේ අධිකරණයන් යොදාගනු ලබන පරීක්ෂණයන් යොදාගනු ලබන පරීක්ෂණයන් සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර අදාල නෛතික ප්‍රතිපාදන සහ නඩු තීරණ නීතිය ඇසුරින් තහවුරු කරන්න.

06. ඒවායේ ශක්තිමත්භාවයන් හා දුර්වලතාවයන් මතුකරදක්වමින් ශ්‍රී ලංකාව තුල යුක්තිය පසිඳලීමේ දී යොදාගනු ලබන විකල්ප ආරවුල් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණයන් සාකච්ඡා කරන්න. ඒවායේ කාර්යක්ෂමතාවය නැංවීම සඳහා යෝජනා ද ඉදිරිපත් කරන්න.

07. "ශ්‍රී ලංකාවේ නීතිඥයන් සඳහා ආචාරධර්මයන්" යනුවෙන් ශ්‍රී ලංකාවේ නවක නීතිඥයන් අතරෙහි බෙදා දීම සඳහා කෙටි පත්‍රිකාවක් සූදානම් කිරීමේ කර්තව්‍ය ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙක් ඔබ වෙත පවරා ඇතැයි උපකල්පනය කරමින්, ඔබගේ මතය අනුව, සමකාලීන ශ්‍රී ලාංකීය නවක නීතිඥයන්ට වඩාත්ම වැදගත්වන වෘත්තීය ආචාරධර්ම පැතිකඩයන් හතක් (07) අවම වශයෙන් කේන්ද්‍රගත කර ගනිමින් ඔබගේ කෙටි පත්‍රිකාව පිළියෙල කරන්න.

○∘○∘○∘○∘○∘○∘○∘○∘